පරිගණකයේ වැදගත්කම - 6 ශ්‍රේණිය

සැකසුම - එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා පාසල - බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල, අම්පාර

• ආදරණීය දුවේ, පුතේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පෙළ පොතේ පළමු ඒකකය නැවත කියවා ඔබේ මතකය ආවර්ජනය කර මෙම කාර්යය පත්‍රිකාව සිදුකරන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. පරිගණකයේ ප්‍රධාන කාර්යයක් නොවන්නේ මින් කුමක් ද?

1. ආදානය 2. ප්‍රතිදානය 3. ආචයනය 4. සැකසීම

2. නිහිත පරිගණක පද්ධති ඇතුළත් නොවන උපකරණයකි

1. සුහුරු ජංගම දුරකථනය
2. විදුලි පන්දම
3. රෙදි සෝදන යන්ත්‍රය
4. නූතන රූපවාහිනී

3. පහත දී ඇති උපක්‍රම අතරින් ආදාන උපක්‍රමයක් වන්නේ මින් කුමක්ද?

1. යතුරු පුවරුව (Keyboard)
2. මුද්‍රණ යන්ත්‍රය (Printer)
3. පරිගණක තිරය (Monitor)
4. දෘඩ තැටිය (Hard disk)

4. පහත දී ඇති උපක්‍රම අතරින් ප්‍රතිදාන උපක්‍රමයක් වන්නේ මින් කුමක්ද?

1. මයික්‍රෝෆෝනය (Microphone)
2. යතුරු පුවරුව (Keyboard)
3. මුද්‍රණ යන්ත්‍රය (Printer)
4. මූසිකය (Mouse)

5. පහත දැක්වෙන රූප අතරින් මධ්‍ය සැකසුම් ඒකකය තෝරන්න,

1.



2.



3.



4.



6. ආචයන උපක්‍රමයක් වන්නේ මින් කුමක් ද,

1. RAM 2. CPU 3. NIC 4. DVD

7. ලිපි ලේඛන සකස් කිරීම සඳහා ඉයාදා ගන්නා මෘදුකාංග වර්ගය මින් කුමක් ද?

1. විඩියෝ සංස්කරණ මෘදුකාංග
2. චිත්‍රක මෘදුකාංග
3. වදන් සැකසුම් මෘදුකාංග
4. මාධ්‍ය ධාවක මෘදුකාංග

0717381099

8. පාසලේදී පරිගණක පද්ධති යොදා ගන්නා අවස්ථාවක් නොවන්නේ මින් කුමක් ද?

1. පාඩම් ඉගැන්වීම සඳහා
2. අමතර විෂය කරුණු ලබා ගැනීම සඳහා
3. කාර්යාලයීය කටයුතු සඳහා
4. මුදල් තැන්පත් කිරීම සඳහා

* පරිගණක පද්ධති භාවිත වන අවස්ථාවන් ප්‍රශ්න අංක **9** සහ **10** හි දක්වා ඇත. ඒවා කුමන ක්ෂේත්‍රයේ භාවිතයන්ද යන්න දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

9.



1. බැංකුව
2. ගොවිපොළ
3. රෝහල
4. පාසල

10.



1. ගොවිපොළ
2. පාසල
3. රෝහල
4. බැංකුව

- පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. i) පරිගණකයේ මූලික කාර්යය ලියන්න.
ii) පරිගණකයට දත්ත ඇතුළත් කිරීම හා තොරතුරු පිටතට ලබා ගැනීමහැදින්වීමට යොදා ගන්නා නම් ලියන්න.
iii) පරිගණකය සතු ලාක්ෂණික ගුණාංග 05ක් නම් කරන්න.

02. i) පරිගණකයේ ඇති කොටස් (උපක්‍රම) යොදා ගන්නා කාර්යය අනුව වෙන්කළ හැකි ආකාර 4ක් ලියන්න.
ii) එම එක් ආකාරයකට උදාහරණ අවමය 2ක් වත් වන සේ ලියන්න.

03. i) මෘදුකාංග යනු මොනවාද?
ii) ඔබ පරිගණකය යොදා ගනිමින් විවිධ ක්‍රියාවන් සිදු කරන විට යොදා ගන්නා මෘදුකාංග වර්ග 4ක් ලියන්න.

04. i) වර්තමානයේ පරිගණකය සෑම ස්ථානයකම දක්නට ලැබේ. පරිගණක පද්ධති දක්නට ලැබෙන ක්ෂේත්‍ර 5ක් නම් කරන්න
ii) පාසල තුළ දී පරිගණකය යොදා ගන්නා ආකාරය ලියන්න.

05. පහත දී ඇති අවස්ථා සළකන්න. එය අයත්වන ක්ෂේත්‍රය ලියන්න.
i) මුදල් තැම්පත් කිරීම හා මුදල් ලබා ගැනීම
ii) හෘදයේ සැත්කමක් සිදු කරන විට හෘදයේ ක්‍රියාකාරිත්වය පරිගණක තිරයකින් නිරීක්ෂණය
iii) රොබෝ තාක්ෂණය යොදා ගනිමින් වාහන නිපදවීම
iv) උපකරණයක් මඟින් වගාවට ජලය ඉසීම

පරිගණක විද්‍යාගාරය ආරක්ෂිතව භාවිතය - 6 ශ්‍රේණිය

සැකසුම - එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා පාසල - බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල, අම්පාර

• ආදරණීය දුවේ, පුතේ, කොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පෙළ පොතේ දෙවන ඒකකය නැවත කියවා ඔබේ මතකය ආවර්ජනය කර මෙම කාර්යය පත්‍රිකාව සිදුකරන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. පරිගණක විද්‍යාගාරයක් නිවැරදිව භාවිත කළ යුත්තේ ඇයි?

1. පරිගණක විද්‍යාගාරයක ඇති උපාංගවල ආරක්ෂාව සඳහා පමණි.
2. පරිගණක විද්‍යාගාරය භාවිත කරන අපගේ ආරක්ෂාව සඳහා පමණි.
3. පරිගණක විද්‍යාගාරයේ ඇති උපාංග ඉතා වටිනා නිසා පමණි.
4. ඉහත සියල්ලම නිසාවෙනි.

2. පරිගණක විද්‍යාගාරය පරිහරණයේදී අපගේ ආරක්ෂාව සඳහා සිදු කළ යුතු නොවන්නේ,

1. රැහැන් හා කෙවෙනි සහිත උපාංග ඇල්ලීමේදී ප්‍රවේශම් වීම.
2. ගිනි නිවන උපකරණ ඇත්නම් ඒවා පිළිබඳව දැනුවත් වීම.
3. පරිගණක විද්‍යාගාරයෙන් පිටවන දොරටු පිළිබඳව දැනුවත් වීම.
4. පරිගණක විද්‍යාගාරයේ දුව පැන ඇවිදීම.

3. පරිගණක විද්‍යාගාරයේ උපාංගවල ආරක්ෂාව සඳහා සිදුකළ යුතු වන්නේ?

A. භාවිතයෙන් පසු උපකරණ නිසි පරිදි ක්‍රියා විරහිත කිරීම.
B. භාවිත කළ පසු උපකරණ අදාළ ස්ථානවල තැබීම.
C. විද්‍යාගාරය හා සියලු උපකරණ දුහුවිල්ලෙන් තොරව පිරිසිදුව තබා ගැනීම.

1. A හා B පමණක් නිවැරදි
2. A හා C පමණක් නිවැරදි
3. B හා C පමණක් නිවැරදි
4. A, B, C සියල්ල නිවැරදි

4. පරිගණක විද්‍යාගාරයක් භාවිත කරන ඔබගේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවස්ථාවකි,

1. විද්‍යාගාරය තුළ පාවහන් පැළඳීම.
2. ගුරුතුමා දැනුවත් නොකර පැන් ධාවකය පරිගණකයට සම්බන්ධ කිරීම.
3. විදුලි රැහැන් ආදිය නොසැළකිලිමත්ව ඇල්ලීම.
4. ගිනි නිවන උපකරණ පිළිබඳව දැනුවත් වීම.

5. පරිගණකය ක්‍රියාත්මක කිරීමට අනුගමනය කළ යුතු පියවර පිළිවෙළින් දැක්වෙන්නේ,

A	B	C	D
			

1. A, B, C, D
2. B, C, D, A
3. C, D, B, A
4. C, B, D, A

0717381099

6. පරිගණකය ක්‍රියාවිරහිත කිරීමට අනුගමනය කළ යුතු පියවර පිළිවෙළින් දැක්වෙන්නේ,

A	B	C	D	E
				

1. B, D, E, A, C 2. A, B, C, D, E 3. E, D, C, B, A 4. E, B, D, A, C

7. පරිගණයක් පරිහරණයේදී පවත්වා නොගත යුතු ඉරියව්වක් වන්නේ මින් කුමක් ද?

A	B	C
		

1. A පමණි 2. B පමණි 3. A, B පමණි 4. C පමණි

8. 3R සංකල්පයට අයත් ක්‍රමවේදයක් නොවන්නේ මින් කුමක් ද?

1. Reuse 2. Reduce 3. Remade 4. Recycle

9. ශක්තිමත් මුරපදයක් ලෙස යෙදිය හැක්කේ,

1. nisal 2. Nisal2021 3. Nisal@Bgns 4. 20100812

10. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යයක් ලෙස බැහැර වන මූල ද්‍රව්‍යයක් නොවන්නේ,

1. මර්කරි 2. ලෙඩ් 3. හීලියම් 4. බේරියම්

- පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. i) පරිගණක විද්‍යාගාරයේදී ඔබගේ ආරක්ෂාවට අනුගමනය කළ හැකි දේවල් 3ක් ලියන්න.
ii) පරිගණක විද්‍යාගාරයේදී උපාංගවල ආරක්ෂාවට අනුගමනය කළ හැකි දේවල් 3ක් ලියන්න.

02. i) පරිගණකය ක්‍රියාත්මක කරන ආකාරය පියවර 4 කින් ලියන්න.
ii) පරිගණකය ක්‍රියා විරහිත කරන ආකාරය පියවර 4 කින් ලියන්න.

03. පරිගණක විද්‍යාගාරයේදී අපි අනුගමනය කළ යුතු හොඳ පුරුදු 5ක් ලියන්න.

04. I) පරිගණකය භාවිතයේ දී නිවැරදි ඉරියව් පවත්වා ගත යුතු ආකාරය රූප සටහනකින් අඳින්න.

ii) නිවැරදි ඉරියව් භාවිතා නොකිරීම නිසා ඇති විය හැකි ශාරීරික අපහසුතා 4ක් ලියන්න.

05. I) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය යනු මොනවාද?
ii) ඒ සඳහා උදාහරණ 4ක් ලියන්න.
iii) පරිගණකයට මුරපදයක් යෙදීමේ දී සැළකිළිමත් විය යුතු කරුණු 4ක් ලියන්න.

මෙහෙයුම් පද්ධති හා ගොනු හැසිරවීම - 6 ශ්‍රේණිය

සැකසුම - එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා පාසල - බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල, අම්පාර

• ආදරණීය දුවේ, පුතේ, කොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පෙළ පොතේ තෙවන ඒකකය නැවත කියවා ඔබේ මතකය ආවර්ජනය කර මෙම කාර්යය පත්‍රිකාව සිදුකරන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. මෙහෙයුම් පද්ධතියක්(**Operating System**) යනු කුමක් ද?

1. දෘඪාංගයකි(Hardware)
2. මෘදුකාංගයකි(Software)
3. ස්ථිරාංගයකි (Firmware)
4. ජීවාංගයකි(Liveware)

2. පහත දැක්වෙන්නේ කුමන මෙහෙයුම් පද්ධතිය(**operating system**) සඳහා භාවිත කරන සංකේතය(**logo**) ද?



1. වින්ඩෝස් (Windows) මෙහෙයුම් පද්ධතිය
2. ලිනක්ස්(Linux) මෙහෙයුම් පද්ධතිය
3. අයිඕඑස්(iOS) මෙහෙයුම් පද්ධතිය
4. ඇන්ඩ්‍රොයිඩ්(Android) මෙහෙයුම් පද්ධතිය

3. මෙහෙයුම් පද්ධතියක් (**operating system**) සඳහා උදාහරණයක් නොවන්නේ කුමක් ද?

1. වින්ඩෝස් (Windows) 2. ඔරකල් (Oracle) 3. රෙඩ්හැට් (red hat) 4. මැක් ඕඑස් (Mac OS)

4. පහත දැක්වෙන්නේ කුමන මෙහෙයුම් පද්ධතිය(**operating system**) සඳහා භාවිත කරන සංකේතය(**logo**) ද?

1. ලිනක්ස් (Linux) මෙහෙයුම් පද්ධතිය
2. රෙඩ්හැට් (red hat) මෙහෙයුම් පද්ධතිය
3. ඇන්ඩ්‍රොයිඩ්(Android) මෙහෙයුම් පද්ධතිය
4. වින්ඩෝස් (Windows) මෙහෙයුම් පද්ධතිය

5. ගොනුවක්(**file**) කොටස් දෙකකින් යුක්ත වේ. ඒවා මොනවා ද?

1. ගොනු නාමය(file name) හා ගොනුව නිර්මාණය කළ දිනය
2. ගොනු නාමය සහ ගොනුවේ අයිතිවාසිකම්
3. ගොනු නාමය සහ ගොනු දිගුව
4. ගොනු දිගුව(file extension) සහ ගොනුවේ ධාරිතාව(file size)

6. පහත සඳහන් රූප සටහනේ ඊතලයෙන් දැක්වෙන්නේ කුමක් ද?



1. කවුළුවක් අවම කිරීම. (minimize)
2. කවුළුවක් උපරිම කිරීම.(Maximize)
3. කවුළුවක් ප්‍රතිප්‍රමාණය කිරීම. (resize)
4. කවුළුවක් වසා දැමීම. (close)

0717381099

7. පහත සඳහන් ගොනුවේ(**file**), ගොනු දිගුව(**file extension**) වන්නේ කුමක් ද?

Termtest.docx

1. Term 2. docx 3. Termtest 4. Termtest.docx

8. ගොනුවක් හෝ ගොනු බහාලුමක් විවෘත කර ගැනීමට(**open**) මූසිකය(**mouse**) ආධාරයෙන් කළ යුත්තේ කුමක් ද?

1. ක්ලික් කිරීම. (clicking)
2. දෙවරක් ක්ලික් කිරීම. (double clicking)
3. තෙවරක් ක්ලික් කිරීම. (triple clicking)
4. ඇදගෙන යාම. (dragging)

9. ගොනුවක් පරිගණකයෙන් ඉවත් කිරීම පහත කුමක් ලෙස හැඳින්වේ ද?

1. Remove 2. Erase 3. Rename 4. Delete

10. ගොනු බහලුමක් (**folder**) නිර්මාණය කිරීමේ (**create**) නිවැරදි පියවර කුමක් ද?

1. Left click -----> Open ------> Folder
2. Right click -----> New------> Folder
3. Double click -----> Rename------> Folder
4. Left Click ----> New ------> Folder

- පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. I) මෙහෙයුම් පද්ධති සඳහා උදාහරණ 4ක් ලියන්න.
ii) මෙහෙයුම් පද්ධතියේ කාර්යයක් ලියන්න.

02. i) පරිගණකයේ දැකිය හැකි ගොනු වර්ග 4 ක් ලියන්න.
ii) ගොනුවක දැකිය හැකි ප්‍රධාන කොටස් 2 ලියන්න.

03. දී ඇති කවුලුවේ A, B, C කොටස් නම් කරන්න. ඒවායේ කාර්යය ලියන්න.



04. ගොනු බහාලුමක් යනු කුමක්ද? ගොනු බහාලුමක රූපයක් අඳින්න.

05. පහත දැක්වෙන රූප දෙස බලා ගොනු හා ගොනු බහාලුම් වෙන් කරන්න.

ඵලදායීතා වීඩියෝ





යෙදුම් මෘදුකාංග භාවිතය සඳහා මූසිකය හා යතුරු පුවරුව යොදා ගැනීම - 6 ශ්‍රේණිය

සැකසුම - එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා පාසල - බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල, අම්පාර

• ආදරණීය දුවේ, පුතේ, කොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පෙළ පොතේ හතරවන ඒකකය නැවත කියවා ඔබේ මතකය ආවර්ජනය කර මෙම කාර්යය පත්‍රිකාව සිදුකරන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. පරිගණකයෙන් සිදුකළ හැකි කාර්යයක් වන්නේ,

   A වීඩියෝ නැරඹීම B විද්‍යුත් තැපැල් ලිපි යැවීම C පින්තූර සැකසීම

   1. A පමණි 2. B පමණි 3. A හා B පමණි 4. A, B, C සියල්ලම

2. පොදු කාර්යය සඳහා යොදා ගන්නා යෙදුම් මෘදුකාංගයක් වන්නේ,

   1. වදන් සැකසුම් මෘදුකාංග 2. පරිගණක ක්‍රීඩා 3. වෙබ් අත්‍රිකිසු 4. චිත්‍රක මෘදුකාංග

3. විශේෂ කාර්ය සඳහා යොදාගන්නා යෙදුම් මෘදුකාංගයක් වන්නේ,

   1. පාසල් කළමනාකරණ පද්ධතිය 2. පුස්තකාල කළමනාකරණ පද්ධතිය
   3. පැතුරුම්පත් මෘදුකාංග 4. බැංකු කළමනාකරණ පද්ධතිය

4. මූසිකයේ (mouse) ප්‍රධාන කොටසක් නොවන්නේ මින් කුමක්ද?

   1. වම් බොත්තම 2. දකුණු බොත්තම 3. ස්පින්ඩලය 4. රෝල් කිරීමේ රෝදය

5. මූසිකය යොදා ගෙන කරනු ලබන කාර්යයක් නොවන්නේ මින් කුමක්ද?

   1. අවශ්‍ය දේ තේරීම 2. ලිපි ලේඛන මුද්‍රණ කිරීම
   3. අවශ්‍ය දේ විවෘත කිරීම 4. අවශ්‍ය දේ එහා මෙහා ගෙන යාම

6. වචන අතර ඉඩ තැබීම සඳහා යොදා ගන්නා යතුර වන්නේ මින්කුමක් ද?

   1. Caps lock 2. Shift 3. Spacebar 4. ctrl

7. D යතුරු ලියනය කිරීමට යොදා ගත හැකි යතුරු පුවරුවේ යතුරු වන්නේ,

   1. Tab + d 2. Ctrl + d 3. Home + d 4. Shift + d

8. චිත්‍ර හා රූප සටහන් පරිගණකය ආශ්‍රයෙන් ඇඳීම සඳහා යොදා ගන්නා මෘදුකාංග අයිකනයක් නොවන්නේ මින් කුමක්ද?

   1. 2. 3. 4.

9. ලිපි ලේඛන සැකසීම සඳහා යොදා ගන්නා වදන් සැකසුම් මෘදුකාංගයක අයිකනයක් නොවන්නේ මින් කුමක් ද?

   1. 2. 3. 4.

0717381099

10. පහත දැක්වෙන මෘදුකාංග අයිකන අතරින් ශ්‍රව්‍ය හා දෘෂ්‍ය සංස්කරණ සඳහා යොදා ගන්නා මෘදුකාංගවල අයිකන පමණක් අඩංගු පිළිතුර වන්නේ,

A	B	C	D

1. A හා B පමණි 2. B හා C පමණි 3. A, B හා D පමණි 4. A, B, C, D සියල්ලම

- **පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. I) පරිගණකය යොදා ගෙන කළ හැකි කාර්යයන් 5 ක් ලියන්න.
ii) පොදු කාර්යය හා විශේෂ කාර්යය සඳහා යොදා ගන්නා යෙදුම් මෘදුකාංග 3 බැගින් ලියන්න.

02. i) යෙදුම් මෘදුකාංග භාවිතයේ දී ප්‍රධාන වශයෙන් යොදා ගන්නා දෘඩාංග 2 නම් කරන්න.
ii) යතුරු පුවරු හා මූසික වර්ග රැසක් දැකිය හැක.ඒවා මොනවාද?

03. ii) මූසිකයක් ඇද එහි ප්‍රධාන කොටස් නම් කරන්න.
iii) මූසිකයක් යොදා ගනිමින් කළ හැකි කාර්යයන් 3ක් ලියන්න.

04. I) යතුරු පුවරුවක විවිධ යතුරු වර්ග දැකිය හැක. එවැනි යතුරු වර්ග 3ක් ලියන්න.
ii) යතුරු පුවරුවේ පහත යතුරු වලින් කරනු ලබන කාර්යය ලියන්න.
   a) Space bar
   b) Tab
   c) Shift
   d) Enter

05. I) ඔබ දන්නා යෙදුම් මෘදුකාංග වර්ග කිහිපයක් ලියන්න.
ii) එම යෙදුම් මෘදුකාංග සඳහා උදාහරණ ලියන්න.

තොරතුරු රැස් කිරීම හා සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිතය - 6 ශ්‍රේණිය

සැකසුම - එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා පාසල - බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල, අම්පාර

• ආදරණීය දුවේ, පුතේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පෙළ පොතේ හයවන ඒකකය නැවත කියවා ඔබේ මතකය ආවර්ජනය කර මෙම කාර්යය පත්‍රිකාව සිදුකරන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. අන්තර්ජාලය නිර්මාණය වී ඇත්තේ ලොව පුරා විසිරී ඇති,

   A පරිගණකවල එකතුවෙනි B ගණක යන්ත්‍රවල එකතුවෙනි C පරිගණක ජාලවල එකතුවෙනි

   1. A පමණි 2. B පමණි 3. A හා C පමණි 4. A, B, C සියල්ලම

2. අන්තර්ජාලය භාවිතා කර සිදුකර ගත හැකි කාර්යයක් වන්නේ,

   A පුවත්පත් කියවීම B හාණ්ඩ මිලට ගැනීම C වීඩියෝ නැරඹීම

   1. A පමණි 2. B පමණි 3. A හා C පමණි 4. A, B, C සියල්ලම

3. දක්වා ඇති රූප අතරින් වෙබ් අතිරික්සුවක් නොවන්නේ කුමක්ද?

   1. 2. 3. Google 4.

4. වෙබ් අතිරික්සුවක් භාවිතා කරන අනුපිළිවෙළ නිවැරදිව දක්වා ඇත්තේ

   A. වෙබ් අතිරික්සුව විවෘත කරන්න.

   B. Enter යතුර ඔබන්න.

   C. විවෘත කිරීමට අවශ්‍ය වෙබ් අඩවියේ ලිපිනය, ලිපින පට්ටිත තුළ ඇතුළත් කිරීම

   1. A, B, C 2. B, A, C 3. A, C, B 4. C, A, B

5. වෙබ් අතිරික්සුවක ඇති මෙවලමක් නොවන්නේ මින් කුමක්ද?

   1. Capslock 2. Refresh 3. Home 4. Forward

6. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා යොදා ගනු ලබන අධ්‍යාපනික වෙබ් අඩවියක් වන්නේ මින් කුමක් ද?

   1. www.e-thaksalawa.lk 2. www.ikman.lk

   3. www.bbc.com 4. www.sarigama.lk

7. සෙවුම් යන්ත්‍රයක් යනු,

   1. අන්තර්ජාලයෙන් කරුණු සෙවීමට භාවිතා කරන මෘදුකාංගයකි.
   2. අන්තර්ජාලයෙන් වීඩියෝ නැරඹීමට භාවිතා කරන මෘදුකාංගයකි.
   3. වීඩියෝ සංස්කරණය සඳහා යොදා ගන්නා මෘදුකාංගයකි.
   4. පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා යොදා ගනු ලබන මෘදුකාංගයකි.

0717381099

8. දක්වා ඇති රූප අතරින් සෙවුම් යන්ත්‍රයක් සඳහා උදාහරණයක් නොවන්නේ මින් කුමක්ද?

1. Google 2. 3. YAHOO! 4. 

9. වෙබ් අඩවියකට පිවිසීම සඳහා භාවිතා කළ හැකි ශක්තිමත් මුරපදයක් වන්නේ මින් කුමක් ද?

1. gamage123 2. 19920531 3. gamage@A123 4. Gamage1992

10. පහත දැක්වෙන අයිකන අතරින් පළමුවැන්න සෙවුම් යන්ත්‍රයක් ද දෙවැන්න වෙබ් අතිරික්සුවක්ද ලෙද පිළිවෙළින් දැක්වෙන්නේ,

A	B	C	D
	Google	YAHOO!	

1. A හා D 2. B හා C පමණි 3. B හා D පමණි 4. A හා B

- **පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. I) වෙබ් අතිරික්සුවක් යනු කුමක්ද?
ii) වෙබ් අතිරික්සු 3ක් ලියන්න.
III) වෙබ් අතිරික්සුවක් භාවිතා කරන ආකාරය පියවර 3කින් ලියන්න

02. I) සෙවුම් යන්ත්‍රයක් යනු කුමක්ද?
ii) සෙවුම් යන්ත්‍ර 3ක් ලියන්න.
III) සෙවුම් යන්ත්‍රයක් විවෘත කර භාවිතා කරන ආකාරය පියවර 4කින් ලියන්න

03. පහත වගුවේ දක්වා ඇත්තේ වෙබ් අතිරික්සුවක දක්නට ලැබෙන මෙවලම් කිහිපයකි. ඒවායේ කාර්යය ලියන්න.

මෙවලම	කාර්යය
1. Home	
2. Refresh	
3. Back	
4. Forward	
5. History	

04. විද්‍යුත් තැපෑල ආරක්ෂිතව භාවිතා කරන ආකාරය ලියන්න.

05. සෙවුම් යන්ත්‍රයකින් කරුණු සෙවීමේ දී අනුගමනය කළ යුතු කරුණු 3ක් ලියන්න.